# ගනුදෙනුකරු හා ගිවිසුම

මෙම ගිවිසුම ........................................(ගිවිසුම) දින NSB ෆන්ඩ් මැනේජ්මන්ට් සමාගම ලියාපදිංචි ලිපිනය 400 ,ගාලු පාර, කොළඹ 03 දරන, ශ්‍රී ලංකා නීතිය යටතේ සමාගම් ලියාපදිංචි කිරීමේ අංක පී.බී. 795 දරන නීතිය ප්‍රකාරුව ලියාපදිංචි කරනු ලැබූ සංස්ථාපිත සමාගමක් වන අතර ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ ප්‍රථමික අලෙවිකරුවා ද වේ. (මින් ඉදිරියට ,අලෙවි නියෝජිත)
හා.. ............................................................................................ ජාතික හැඳුනුම්පත .......................................

(ස්ථිර ලිපිනය / අයදුම්කරුගේ ලියාපදිංචි ලිපිනය)
(මින් ඉදිරියට ,පාරිභෝගිකම)

....................................................................................................................................................................................

(ඒකාබද්ධ ඉල්ලුම්කරුගේ නම)
.............................................................................. (අදාළ වන පරිදි ජාතික හැඳුනුම්පත / විදේශ ගමන්බලපත්‍රය / හෝ සමාගමෙහි ලියාපදිංචි අංක )

....................................................................................................................................................................................

....................................................................................................................................................................................

(ස්ථිර ලිපිනය / හවුල් අයදුම්කරුගේ ලියාපදිංචි ලිපිනය)

බවට සාක්ෂි දැරීම:

ලියාපදිංචි ස්කන්ධ හා සුරැකුම්පත් ආඥා පනත සහ දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥා පනතට අනුකූල ව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නියෝජිත සෘජු සහභාගිකරුවෙකු ලෙස නියෝජිතවරයා ලියාපදිංචි කරනු ලැබූ අවස්ථාවේ දී සහ සිය පාරිභෝගිකයන් වෙනුවෙන් නිර්ලේඛන සුරැකුම්පත් යටතේ ගනුදෙනු කිරීමට බලය ඇති විට.

එසේම, ගණුදෙනුකරු නිර්ලේඛන සුරැකුම්පත් අනුව ගනුදෙනු කිරීම සඳහා කැමති වන විට හෝ නියෝජිතයා තුළින් උනන්දුවක් පළ කරනු ලැබූ විට සහ/හෝ එවැනි නිර්ලේඛන සුරැකුම්පත් හෝ අදාළ අභිරුචීන් අත්පත් කර ගැනීම හෝ පවරා දීම පිළිබඳ ව ඇති හැකියාවන් ගැන නියෝජිතයා සමඟ සාකච්ඡා කරන අවස්ථාවේ දී❑

ප්‍රත්‍යුත්පන්න ව, ඒ අනුව,මින් ඉදිරියට පිහිටුවනු ලබන අන්‍යෝන්‍ය සම්මුති ප්‍රකාර ව, අනෙකුත් වටිනා සහ ප්‍රයෝජ්‍ය දෑ පිළිබඳ සැලකීමෙන් පසු, මෙහිලා පිළිගනු ලබන බාර ගැනීම් ප්‍රකාර ව, මතු දැක්වෙන කරුණු අනුව සම්මුතිය කෙරෙහි අනුකූල හා එකඟ වනු ලැබේ.

1. අර්ථ දැක්වීම්

1.1 නියෝජිත වශයෙන් මෙහිදී අදහස් කෙරෙන්නේ NSB ෆන්ඩ් මැනේජ්මන්ට් සමාගමයි.

1.2 ගනුදෙනුකරුවා ඉහත අර්ථ දැක් වූ ආකාරයෙන් විය යුතු වන අතර සංදර්භීය තත්ත්වයන් යටතේ නෛතික අනුප්‍රාප්තික නියෝජිතයෙකු හෝ එවැනි ගනුදෙනුකරුවෙකුගේ ධන්‍යය තත්ත්වය ද ඊට අන්තර්ගත වේ.

1.3 දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥාපනතට අනුකූල ව නිකුත් කරනු ලැබූ නිර්ලේඛන භාණ්ඩාගාර බිල්පත් නිර්ලේඛන භාණ්ඩාගාර බිල්පත් යනුවෙන් අදහස් වන අතර මෙම ආඥාපනත යටතේ නිර්ලේඛන භාණ්ඩාගාර බිල්පත් බවට පරිවර්තනය කරනු ලැබූ භාණ්ඩාගාර බිල්පත් ද මීට ඇතුළත් විය යුතුය.

1.4 නිර්ලේඛන සුරැකුම්පත් යනුවෙන් හඳුන්වනු ලබන්නේ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිර්ලේඛන ස්වරූපයෙන් මුදල් නීති පනත යටතේ නිකුත් කරන ලද නිර්ලේඛන භාණ්ඩාගාර බැඳුම්කර, නිර්ලේඛන භාණ්ඩාගාර බිල්පත් හා සුරැකුම්පත් ය.

1.5 මුදල් නීති පනතේ වගන්තිය 5 යටතේ පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා මහ බැංකුව මහ බැංකුව ලෙස මෙහිදී අදහස් කෙරේ.

1.6 නිර්ලේඛන භාණ්ඩාගාර බිල්පත්හි සහ සිය ගනුදෙනුකරුවන්ගේ වෙනත් නිර්ලේඛන සුරැකුම්පත්වල ශීර්ෂ සහ අවශ්‍යතා වාර්තා කිරීමට නියෝජිතයා විසින් ලංකාසෙක්යු හි පවත්වා ගෙන යනු ලබන ගිණුම සුරැකුම්පත් ගිණුම වශයෙන් හඳුන්වනු ලැබේ.

1.7 ඉලෙක්ට්‍රොනික ආකාරයෙන් නිර්ලේඛන සුරැකුම්පත් නිකුත් කිරීම, සම්භාරයන් පවත්වා ගැනීම සහ එබඳු නිර්ලේඛන සුරැකුම්පත් සඳහා හිමිකාරීත්වය සහ අවශ්‍යතා වාර්තා කිරීම සඳහා මුදල් නීති පනත අනුව පිහිටුවන ලද නිර්ලේඛන සුරැකුම්පත් සන්ධාපනාල පද්ධතිය ලංකාසෙක්යු යනුවෙන් හඳුන්වනු ලබන අතර ලංකාසෙට්ල්හි සංරචකයක් නිර්මාණය කෙරෙන ආකාරයෙන් නිර්ලේඛන සුරැකුම්පත්හි ගනුදෙනු බේරුම්කරණය ද ඊට අයත් වේ.

1.8 ලංකාසෙට්ල් යනුවෙන් හඳුන්වනු ලබන්නේ මුදල් නීති පනතේ 62 (අ) සහ 112 (අ) වගන්තිවල අවශ්‍යතාව පරිදි පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා තථ්‍යකාල දළ බේරුම්කරණ සහ නිර්ලේඛන සුරැකුම්පත් සන්ධාපනාල පද්ධතිය ලංකාසෙට්ල් යනුවෙන් හඳුන්වනු ලැබේ.

1.9 පද්ධති නීති යනුවෙන් හඳුවන්වනු ලබන්නේ මහ බැංකුව විසින් හඳුනා ගනු ලැබූ ක්‍රියාපටිපාටි සහ ප්‍රමිතීන් වන අතර ලංකාසෙට්ල් හි මෙහෙයුම් පාලනය සිදු කෙරෙන මුදල් නීති පනත යටතේ කලින් කලට සහභාගීකරුවන් වෙත එවා නිකුත් කරනු ලබන අරත සහ ලංකාසෙට්ල්හි සෘජු සහභාගීත්වය ඊට හිමි වේ.

2. නියෝජිතයන්ගේ යුතුකම් සහ බැඳීම්

අදාළ ලිඛිත නීතිය ප්‍රකාර ව නියෝජිතයා වෙත පනවා ඇති යුතුකම් සහ වගකීම් කෙරෙහි අගතියක් නොවන පරිද්දෙන්❑

2.1 නියෝජිතයා විසින් පිහිටුවන ලද ප්‍රතිපත්ති සහ පටිපාටිවලට අනුකූල ව ගනුදෙනුකරුවා සඳහා නියෝජිතයා විසින් සුරැකුම්පත් ගිණුම / ගිණුම්, පිළිගැනීම, පිහිටුවා ගැනීම සහ පිළිගැනීමට සිදු කෙරෙන අතර මහ බැංකුවේ සහ වෙනත් අදාළ වන සියලුසංස්ථාපිත ආයතනවල සියලුම නීති සහ රෙගුලාසි සහ උපමානයන්ට අනුකූල ව එය සිදු කෙරෙනු ඇත.

2.2 ගනුදෙනුකරුවා වෙනුවෙන් ආඥාවන් ක්‍රියාත්මක කිරීම, නික්ෂේපණය සහ බේරුම්කරණය නියෝජිතයා විසින් ගනුදෙනුකරුවා දෙනු ලැබූ ආඥාවන්ට අනුකූල ව සිදු කෙරෙන අතර මුදල් නීති පනතෙහි පද්ධති නීතිවලට අනුකූල ලෙස ගනුදෙනුකරුවා වෙනුවෙන් ගෙවීම් කිරීම සහ පිළිගැනීම සිදු කරනු ඇත.

2.3 නිර්ලේඛන භාණ්ඩාගාර බිල්පත් සම්බන්ධයෙන් ගනුදෙනුකරුවා ශීර්ෂයන් හෝ නියමයන් ලබා ගන්නා අවස්ථාවල දී පද්ධති නීති ප්‍රකාරව ගනුදෙනුකරුවාට අදාළ නියමයන් ලංකාසෙක්යු හි නියෝජිතයා විසින් නිවැරදිව සහ කඩිනම්ව වාර්තා කරනු ඇත.

2.4 ශීර්ෂයන්හි හෝ අවශ්‍යතාවන්හි සහ සුරැකුම්පත් ගිණුමේ ඇති නිර්ලේඛන භාණ්ඩාගාර බිල්පත්හි හිමිකාරීත්වයට හෝ අවශ්‍යතාවන්ට අදාළ ව යම් වෙනස් කිරීමක් සිදු කළ හොත් නියෝජිතයා විසින් කඩිනම් ව සහ නිවැරදි ව ලංකාසෙක්යුහි එය වාර්තා කරනු ලැබේ.

2.5 ගනුදෙනුකරුවා නිර්ලේඛන භාණ්ඩාගාර බිල්පත් සඳහා ඇතුළත් වීම හෝ නිර්ලේඛන භාණ්ඩාගාර බිල්පත්වලට අදාළ ගිණුමකට ගනුදෙනුවලට අදාළ වෙනත් මූල්‍යමය සම්බන්ධයකට

ගනුදෙනුකරුවා ඇතුළත්වීම සහ යම් හෙයකින් මහ බැංකුව මේ සම්බන්ධයෙන් නිකුත් කරනු ලැබූ නියෝගයන් කෙරෙහි සමපාත වීම අනුව පරිණත තත්ත්වය ප්‍රකාරව නියෝජිතයා විසින් ගනුදෙනුකරුවා වෙත ගෙවීම් කරනු ලැබේ.

2.6 ගනුදෙනුකරුවා සමඟ හෝ වෙනුවෙන් කෙරෙන ගනුදෙනුවල දී නියෝජිතයා විසින් ඊට අදාළ ව නියමිත පරිදි පොත් තැබීම සහ වාර්තා කිරීම සිදු කළ යුතු වන අතර එවැනි පොත් තැබීම් සහ වාර්තා ප්‍රවේශ වීම සඳහා ගනුදෙනුකරුවාට සාධාරණ අවස්ථාවක් තිබිය යුතුය.

2.7 සුරැකුම්පත් ගිණුම සහ ගනුදෙනුකරුවා වෙනුවෙන් පවත්වා ගනු ලැබූ අරමුදල් සම්බන්ධයෙන් නියෝජිතයා විසින් ගනුදෙනුකරුවා වෙත සනාථ කිරීම් සහ ප්‍රකාශන නිකුත් කළ යුතුවේ. මෙම සනාථ කිරීම් සහ ප්‍රකාශන නියෝජිතයා විසින් වාර්ෂිකව සූදානම් කොට, මුද්‍රණය කොට වාර්තාවන්හි සඳහන් වන ඔහුගේ හෝ ඇයගේ ලිපිනය වෙත තැපැල් මඟින් යැවීමේ කාර්යය නියෝජිතයා සිදු කරයි. තැපැල් සේවයේ ඇති වන ප්‍රමාද වීම් සම්බන්ධයෙන් හෝ නියෝජිතයාගේ පාලනයේ සීමාවෙන් එපිට ඇති වෙනත් කරුණු හේතුවෙන් සිදු වන ප්‍රමාද වීම් පිළිබඳ නියෝජිතයා විසින් බැඳීමක් හෝ වගකීමක් නොදරනු ලැබේ.

2.8 නියෝජිතයා මෙම ගිවිසුමට අනුකූල ලෙස කටයුතු කළ යුතු වන අතර ගනුදෙනුකරුවා වෙත සේවා සැපයීමේ ඍජු සහභාගීකරුවා වශයෙන් එහි ඇති වගකීම්, කාර්ය භාරයන් සහ කෘත්‍යයන් ක්‍රියාවට නැංවීමේ දී අදාළ ලිඛිත නීතිය සහ රෙගුලාසි පිළිපැදිය යුතු වේ.

2.9 ලියාපදිංචි ලිපිනය, ව්‍යාපාරික නාමය සහ මහ බැංකුවේ ලියාපදිංචි ස්වභාවයට අදාළව නියෝජිතයා පිළිබඳ විස්තරවල යම් වෙනසක් සිදු වේ නම් ගනුදෙනුකරුවාවෙත ඒ පිළිබඳ ලිඛිත ව දැනුම් දිය යුතුවේ.

2.10 කිසියම් ගනුදෙනුකරුවෙකු හෝ ඔවුන්ගේ ලැබෙන නියෝග ප්‍රතික්ෂේප කිරීම සඳහා තනි තීන්දුවක් ගැනීමේ බලය නියෝජිතයා වෙත ලැබෙන අතර නියෝජිතයා විසින් මීට පෙර පිළිගනු ලැබූ කිසියම් ගනුදෙනුකරුවෙකු ඉවත් කිරීමට ද නියෝජිතයාට බලය ඇත.මෙම අයිතිය අසාධාරණ ලෙස බලයේ නොයෙදවිය යුතු වන අතර කිසියම් නියෝගයක් යම් හෙයකින් ප්‍රතික්ෂේප කරන්නේ නම් එසේ ප්‍රතික්ෂේප කිරීමට හේතු ලිඛිතව දැනුම් දීමක් කළ යුතුවේ.

2.11 ඍ හි සිය රාජ්‍ය සුරැකුම්පත් ගිණුමට අදාළ වාරික ප්‍රකාශන ඊමේල් වැනි ඉලෙක්ට්‍රොනික ක්‍රමයක් මඟින් හෝ තැපැල් පද්ධතිය ඔස්සේ තැපැල් කිරීම මඟින් යම් ගනුදෙනුකරුවෙකු වෙත ලැබීමට මහ බැංකුව සිය රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව ඉඩ පහසුකම් සලසා ඇති බව නියෝජිතයා විසින් ගනුදෙනුකරුවා වෙත මෙහිලා දැනුම් දිය යුතුය. අන්තර් ජාලය ඔස්සේ ද ශ්‍රී ලංකා මහ බැංකුවේ ක්‍රියාත්මක සිය සුරැකුම්පත් ගිණුම දැක බලා ගැනීමේ හැකියාව මහ බැංකුව සපයා ඇති බව ද ගනුදෙනුකරුවා වෙත දැනුම් දිය යුතු වේ.

3. ගනුදෙනුකරුවා බලගැන්වීම සහ පිළිගැනීම

3.1 පහත දැක්වෙන ආකාරයෙන් ගනුදෙනුකරුවා විසින් නියෝජිතයා බලගන්වනු ලැබේ.

3.1.1 ගනුදෙනුකරුවා විසින් නිකුත් කරන ලද උපදෙස්වලට අනුකූල ලෙස හා අදාළ වන නීති සහ රෙගුලාසිවලට ගැළපෙන ආකාරයෙන් නිර්ලේඛන සුරැකුම්පත් සහ ගනුදෙනුකරුවාගේ වුවමනාවන් වෙනුවෙන් සුරැකුම්පත් ගිණුම් ආරම්භ කිරීම සහ පවත්වා ගැනීම.

3.1.2 ගනුදෙනුකරුවා සහ නියෝජිතයා විසින් කලින් කලට මෙම ගිවිසුමට අනුරූපි ලෙස ඉදිරිපත් කෙරෙනු ලිපි සනාථකිරීම් (සනාථකිරීම්) මඟින් දක්වන ලද ගනුදෙනු ක්‍රියාත්මක කිරීම.

3.1.3 පද්ධති නීතිවලට අනුකූල වන ලෙසින් ගිවිසුම ප්‍රකාර ව ගනුදෙනුකරුවා විසින් නිකුත් කරනු ලබන උපදෙස් ක්‍රියාවට නැංවීම.

3.1.4 ගනුදෙනුකරුවා හිමිකම් කියන නිර්ලේඛන සුරැකුම්පත්හි පරිණතභාවය අනුව ලැබෙන උත්පාදන ලබා ගැනීම.

3.1.5 ගනුදෙනුකරුවා වෙත ලිඛිත නිවේදනයක් මඟින් දැනුම් දෙන අතරතුර දී සුරැකුම්පත් ගිණුම්වල ඇති දෝෂ සහිත හර සහ බැර කිරීම් නිවැරදි කිරීම.

3.2 ගනුදෙනුකරුවා පහත දැක්වෙන දෑ පිළිගන්නා අතර එකඟ වෙයි.

3.2.1 නිර්ලේඛන සුරැකුම්පත්වලට අදාළ ව නියෝජිතයාට ගනුදෙනු කිරීමේ ශක්‍යතාව ඇති බවට තෘප්තිමත් වන අතර නියෝජිතයා වෙතින් නියෝගයන් ක්‍රියාත්මක කරවීමට පෙර අදාළ ශක්‍යතාව ඇති බවට කලින් කලට තෘප්තභාවය ඇති කර ගැනීම.

3.2.2 ගනුදෙනුකරුවා විසින් නියෝජිතයා වෙත සපයනු ලබන ගනුදෙනුකරුවන් ලියාපදිංචි කිරීමේ ආකෘති පත්‍රයේ සඳහන් තොරතුරුවල කිසියම් වෙනසක් ඇත්නම් නියෝජිතයා වෙත වහාම ඒ පිළිබඳ ව (තොරතුරු සඳහා අදාළ වන තහවුරු කිරීමක් ද සමඟ) ලිඛිත ව දැනුම් දිය යුතුය.

3.2.3 සියලුම නියෝගයන් ලිඛිත ව ලබා දිය යුතු වන අතර නියෝජිතයා වෙත වාචික නියෝග ලබා දෙන්නේ නම් එම නියෝගවලට අදාළ සියලුම අවදානම ගනුදෙනුකරුවා විසින් දැරිය යුතු වන අතර ඊට අදාළ කිසිදු ක්‍රියාවක් හෝ මඟහැරීමක් සම්බන්ධයෙන් නියෝජිතයා වග නොකියනු ඇත.

3.2.4 නියෝජිතයා සහ/හෝ එම කාර්ය මණ්ඩලය සමඟ කිසියම් සන්නිවේදනයක් සිදු කරන්නේ නම් නියෝජිතයා විසින් ලිඛිතව දැනුම් දී ඇති දුරකථන මාර්ග, ෆැක්ස්මයිල්, සහ ඉලෙක්ට්‍රොනික තැපැල් ලිපින ඇතුළු නිල සන්නිවේදන ක්‍රමවේදයක් භාවිත කළ යුතුවේ.

3.2.5 මූල්‍ය තත්ත්වයන් සහ ආයෝජන අභිලාෂයන් පිළිබඳ ගනුදෙනුකරුවාගේ ස්වයං ඇගයීම අනුව කිසියම් ආයෝජන තීරණයක් ගනු ලැබෙන අතර ගනුදෙනුකරුවා වෙනුවෙන් එවැනි තීරණයක් ගැනීම සඳහා නියෝජිතයා අභිමත බලයක් කිසිදු අවස්ථාවක දී නොලැබෙනු ඇත.

3.2.6 කලින් නිකුත් කරනු ලැබූ නියෝගයක් අහෝසි කිරීම, අවලංගු කිරීම, ප්‍රත්‍යාවර්තනය හෝ සංශෝධනය කිරීම එසේත් නොමැති නම් කලින් නිකුත් කරනු ලැබූ නියෝගයක් සම්බන්ධයෙන් නිවැරදි කිරීමක් සිදු කිරීම වලංගු වන්නේ කලින් නිකුත් කරනු ලැබූ නියෝගය ක්‍රියාත්මක වීමට පෙර ඉල්ලීම ඉදිරිපත් වුවහොත් පම□.

3.2.7 නියෝජිතයාගේ වාර්තා හෝ නියෝගවලට, සන්නිවේදනයන් ක්‍රියාවන්ට හෝ සිදු කළ හෝ ක්‍රියාවට නැංවූ, සැකසුම් කළ හෝ වලංගුභාවයට පත් ගනුදෙනුවලට අදාළ වෙනත් කිසියම් වාර්තා මහ බැංකුව හෝ නියෝජිතයා විසින් නිකුත් කරන ලද සනාථ කිරීම් සහ ප්‍රකාශනවල කිසියම් දොසක් වෙතොත් එවැනි සනාථ කිරීමක් හෝ ප්‍රකාශනයක් ලැබීමෙන් දින 14ක කාලයක් තුළ ගනුදෙනුකරුවා විසින් ලිඛිත ව දැනුම් දීමක් සිදු කොට නොමැති අවස්ථාවේ දී ඉදිරිපත් කර ඇති ගනුදෙනුව සම්බන්ධයෙන් අනුගම්‍ය සහ නිසැක සාක්ෂිබවට පත් වේ.

3.2.8 නිර්ලේඛන සුරැකුම්පත් වෙළඳාම් කිරීමේ දී හෝ පවත්වා ගැනීමේ දී සහ වෙනත් අදාළ ක්‍රියාමාර්ග ගැනීමේ දී මෙම ගිවිසුමේ වගන්ති සහ කොන්දේසිවලට අනුකූල විය යුතු වන අතර නීති සහ රෙගුලාසි, චක්‍රලේඛන සහ වෙනත් අදාළ වන ලිඛිත නීතිය බල පැවැත්වෙනු ඇත.

3.2.9 නියෝජිතයා විසින් අත්පිට මුදල් මඟින් කිසිදු ගෙවීම් කිරීමක් නොකළ යුතුය.

3.2.10 ගනුදෙනුකරුවා වෙනුවෙන් තුන්වැනි පාර්ශ්වයේ චෙක්පත් බාර ගැනීම, ප්‍රතික්ෂේප කිරීම හෝ නිකුත් කිරීමසහ ගනුදෙනුකරුවා වෙනුවෙන් තුන්වැනි පාර්ශ්වයක් සඳහා ලදුපත් නිකුත් කිරීමට ඉල්ලීමක් කිරීම විශේෂිත අවස්ථාවක් නොවන්නේ නම් පමණක් නියෝජිතයාගේ අභිමත තීරණය යටතේ සිදු වේ. මීට අදාළ වගවීම ගනුදෙනුකරුවා මත මුළුමනින් පැවරෙන අතර එහි දී නියෝජිතයා වෙතින් හිමිකම් ඉල්ලීමක් හෝ උපයෝජන ලබා ගැනීමක් ගනුදෙනුකරුවාට සිදු කළ නොහැකිය.

3.2.11 මෙම ගිවිසුමට එළැඹීම තුළින් මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ 2006 අංක 05 දරන පනතේ විධිවිධානවලට සහ මූල්‍ය ගනුදෙනු වාර්තා කිරීමේ 2006 අංක 06 දරන පනතේ විධිවිධානවලට ගනුදෙනුකරුවා යටත් වේ.

3.3 නියෝජිතයාගේ විකුනුම්/අලෙවි කාර්යමණ්ඩලය සඳහා ගනුදෙනුකරුවා වෙනුවෙන් ඔවුන් විසින් සිදු කෙරෙන ගනුදෙනුවලින් ලැබෙන කොමිස් ආදායම් මගින් ගෙවීම් සිදු කෙරෙන බව මෙහිලා ගනුදෙනුකරුවා දැනුවත් කරනු ලැබේ.

4. පාර්ශ්වයන්ගේ වෙනත් අයිතීන් සහ බැඳීම්.

4.1 නියෝජිතයාගේ වෙනත් අයිතීන්වලට අගතියක් නොවන පරිද්දෙන්, ගනුදෙනුකරුවා විසින් ගෙවීමට ඇති මුදල් පැහැර හැරීම, ගෙවීමට නියමිත ණය, ආදී තත්ත්වයන්හි දී එම සියලුම අවස්ථාවන්ට හෝ යමකට හෝ අදාළ ඇවර කිරීමේ/බේරුම් කිරීමේ අයිතියක් නියෝජිතයාට ඇති අතර එවැනි යම් අවස්ථාවක දී ගනුදෙනුකරුවාගේ වගකීම්වලට/බැඳීම්වලට එදිරි ව එබදු ඇවරකිරීම්/බේරුම්කිරීම් ඉදිරියට ගෙන යෑමේ අයිතිය ද ඇත.

4.2 යම් ආකාරයකින් ඇවර කිරීමේ ගිවිසුමක් හෝ බුංවත්භාවයට අදාළ ගිවිසුමක් ගොනු කොට ඇති විට හෝ ඊට එදිරව කිසියම් ඇවර කිරීමේ හෝ බුංවත්භාවය ප්‍රකාශකිරීමේ නියෝගයක් හෝ ආඥාවක් හෝ තීන්දුවක් සම්මත කොට ඇති විට හෝ වාස්තවික බලපෑමක් එල්ල වන ආකාරයේ නෛතික ක්‍රියාවලියක් ගොනු කොට ඇති විට නියෝජිතයා වෙත තොරතුරු ලිඛිතව වහා ලබා දීමට ගනුදෙනුකරුවා එකඟ වෙයි.

4.3 ගනුදෙනුකරුවාගේ බලයලත් නියෝජිතයෙකු විසින් නිකුත් කර ඇති නියෝග සම්බන්ධයෙන් උක්ත නියෝජිතයා වෙත ගනුදෙනුව සම්බන්ධයෙන් බලය පවරනු ලැබූ ලිපිය ප්‍රකාර ව ගනුදෙනුකරුවා අදාළ නියෝගවලට බැඳීමක් දැක් විය යුතුය.

4.4 ව්‍යාපාරය සහ පරිපාලනය මනා ලෙස පවත්වා ගෙන යෑම සඳහා අවශ්‍ය වන සීමාව උල්ලංඝනය නොවන පරිදි සුරැකුම්පත් ගිණුම්වලට සහ ගනුදෙනුකරුවාගේ ගනුදෙනුවලට සහ ඊට අදාළ වන වෙනත් කරුණු හා සම්බන්ධව විශ්වසනීයත්වය පවත්වා ගෙන යෑම සඳහා

ගනුදෙනුකරුවා කටයුතු කළ යුතු වන අතර ගනුදෙනුකරුවා විසින් ලිඛිත ව බලය පැවරීමක් කළොත් හෝ නීතිය මගින් හෝ අධිකරණ නියෝගයක් අනුව ඉල්ලීමක් කෙරුණහොත් හැරෙන්නට ගනුදෙනුකරුවාගේ එබදු ගිණුම් සම්බන්ධයෙන් මහ බැංකුව හැර වෙනත් කිසිදු පාර්ශ්වයකටතොරතුරු හෙළිදරව් නොකළ යුතුය. ගනුදෙනුකරුවාගේ හෝ ඔහුට සම්බන්ධිත පෞද්ගලික දත්ත ද මීට ඇතුළත් වේ.

4.5 පාර්ශ්වයන් සඳහා යම්තාක් ආරක්ෂාවක් සම්පාදනය කෙරෙන මහ බැංකුව විසින් පනවා ඇති ගනුදෙනුකරුවන් පිළිබඳ අධිකාරයට පාර්ශ්වයන් මෙහිලා යටත් වීමට එකඟ වනු ඇත. ශ්‍රී ලංකාමහ බැංකුවේ අඅඅගපඉිකගටදඩගකන වෙබ් අඩෙවිය ඔස්සේ මෙම අධිකාරය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවලින් ලබා ගැනීමට පුළුවන. ගනුදෙනුකරුවාට බලපාන අධිකාරයේ 17 වගන්තිය තුළින් පනවනු ලැබූ වගවීම් සහ ඊට අදාළ වන වෙනත් කරුණු උපග්‍රන්ථය (ආ) හි පහතින් දැක්වේ.

4.6 ගනුදෙනුකරුවාගේ කැමැත්ත මත, නියෝජිතයා වෙත සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි යන භාෂාවලින් ලබා දෙන ලෙසට ලිඛිතව කරනු ලැබූ ඉල්ලීමකට අනුකූලව නිවේදනයන් නිකුත් කිරීම ඇතුළු සියලුසන්නිවේදනයන් සිදු විය යුතුය.


Classification | **NSB Use Only**

4.7 වගකීම් සහ යුතුකම් ක්‍රියාවට නැංවීමේ දී සහ ගනුදෙනුකරුවාට සේවා සැපයීමේ කාර්යයන්හි දී අදාළ වන ලිඛිත නීතිය අනුව නියෝජිතයා කටයුතු කළ යුතු වේ.

5. වගවීම් සීමාව

5.1 නියෝජිතයා සහ එම කාර්ය මණ්ඩලය විසින් සිය පාර්ශ්වයෙන් වන බරපතළ නොසැලකිල්ල, සිතා මතා සිදු කරන විෂමාචාරය හෝ සිතමතා සිදු කරනු ලැබූ අනවධානී ක්‍රියා හේතුවෙන් ගනුදෙනුකරුවා විසින් මුහුණ පානු ලබන සියලුම සෘජු වගවීම් සම්බන්ධ හානි සහ අලාභ සම්බන්ධයෙන් ගනුදෙනුකරුවා සුරැකීමටත් හානි ප්‍රතිපූර්ණය කිරීමටත් නියෝජිතයා එකඟ වනු සහ ඒ සඳහා ක්‍රියාත්මක වනු ඇත. ගනුදෙනුකරුවාට මුහුණ දීමට සිදු වන සෘජු හානි සඳහා පමණක් මෙම වගවීම වලංගු වන බව මෙහිලා විශේෂයෙන් එකඟ වන අතර අවබෝධ කර ගනු ලැබෙන අතර වක්‍ර හෝ අනුෂාංගික හානි හෝ කිසියම් හානියක් සිදු වේ යැයි කල්තබා දැන ගෙන තිබිය දී සිදු වන ලාබ හෝ ආදායම් අහිමි වීම් සඳහා හෝ එවැනි ඇති විය හැකි හානියක් හෝ අලාභයක් සම්බන්ධයෙන් අදාළ පාර්ශ්වයක් කල් තබා දැනුවත් කර තිබිය දී එය වලංගු නොවේ.

5.2 නියෝජිතයාගේ පාර්ශ්වයෙන් ණය පැහැර හැරීමක් හෝ සහදායක නොසලකා හැරීමක් පිළිබඳ වාස්තවික ක්‍රියාත්මක නොමැති අවස්ථාවක දී ගිවිසුමට අනුකූලව ගනුදෙනුකරුවාගේ උපදෙස් ක්‍රියාත්මක කිරීම හේතුවෙන් නියෝජිතයා වෙත දැරීමට සිදු වන සියලුම සෘජු හානි, වගවීම් සහ අලාභවලින් නියෝජිතයා ආරක්ෂා කිරීමට සහ එවා ප්‍රතිපූර්ණය කිරීමට ගනුදෙනුකරුවා එකඟ වන සහ බාර ගන්නා තත්ත්වයට පත් වේ.

6. සමාප්තිය

6.1 මින් පෙර දැරීමට සිදු වූ මූල්‍ය සහ වෙනත් බැදීම් බේරුම් කිරීම්වලට අදාළව අනෙක් පාර්ශ්වය වෙත ලිඛිත දැනුම් දීමකින් හෝ එසේ නොමැති ව මෙම ගිවිසුම සමාප්ත කිරීමට සහ ගිවිසුම ප්‍රකාර සේවාවලට අදාළ ව ගිවිසුමේ සම්බන්ධතා සම්බන්ධයෙන් පාර්ශ්ව දෙකින් ඕනෑම එකකට අවස්ථාව ඇත.

6.2 මෙම ගිවිසුමේ විධිවිධාන අනුව පවතින තත්ත්වයක දී වුව ද පහත දැක්වෙන සිද්ධිවලින් බලපෑමක් නොවන යම් පාර්ශ්වයක් විසින් වහා ලිඛිත නිවේදනයක් මඟින් බලපෑමට ලක් වූ පාර්ශ්වය වෙත දැනුම් දීමක් මඟින් ගිවිසුම සමාප්ත කිරීමට සහ මේ තත්ත්වයේ දී ගිවිසුම ප්‍රකාර ව ඇති සේවා අවසන් කිරීමට ඉඩ ඇත.

6.2.1 මහ බැංකුව විසින් බලය පැවරුනු සෘජු නියෝජිත සහභාගීකරුවෙකු වීම නියෝජිතයාට කිසියම් හේතුවක් නිසා අහිමි වන විට❑

6.2.2 කිසියම් පාර්ශ්වයක ආදායකයා, ඇවරකරුවා හෝ භාරකරුවා හෝ දේපොළවල සැකිය යුතු කොටසක් අධිකරණ නියෝගයක් මඟින් හෝ කිසියම් පාර්ශ්වයක් මඟින් බංකලොත්භාවය හෝ

බුංවත්භාවය සිදු වී ඇති බවට නිර්ණය කළහොත් හෝ කිසියම් පාර්ශ්වයකට එරෙහිව හෝ කිසියම් පාර්ශ්වයක් මඟින් බංකොලොත්භාවය, ප්‍රතිසංවිධානය, ප්‍රතිඥානය, බුංවත්භාවය, ණය ප්‍රතිසමායෝගය, නිරුද්ධිය හෝ ඇවර කිරීමට අදාළව පෙත්සම් ගොනු කර ඇති අවස්ථාවක දී❑

6.2.3 සිය ණයහිමියන්ගේ යහපත වෙනුවෙන් කිසියම් පාර්ශ්වයක් විසින් කිසියම් පැවරුමක් සිදු කරන්නේ නම්, හෝ ණය තත්ත්වය ඇති වන අවස්ථාවේ දී සිය ණය ගෙවීමට නොහැකි බව ලිඛිත පිළිගැනීමේ දී හෝ ඒ සඳහා අදාළ දේපොළෙන් සමස්තය හෝ සැලකිය යුතු කොටසක් වෙනුවෙන් ආදායකයෙකු, භාරකරුවෙකු හෝ ඇවරකරුවෙකු පත් කිරීම සඳහා කැමැත්ත පළ කිරීමේ දී.

6.3 ඉහත තත්ත්වයන් පවතින අතරතුර 2004 අංක 02 දරන ඉහත නිර්ලේඛන භාණ්ඩාගාර බිල්පත් (ගනුදෙනු) රෙගුලාසිවලට අනුකූලව කිසියම් සුරැකුම්පත් ගිණුමක් පවත්වා ගැනීම හෝ ගනුදෙනුකරුවා වෙනුවෙන් ඇති ගනුදෙනුවලින් හෝ නිර්ලේඛන භාණ්ඩාගාර බිල්පත් තුළින් නිර්මාණය වන අරමුදල් පවත්වා ගැනීම නතර කරන තුරු සහ එසේ නොමැති නම් අදාල නීති හා මෙම පාරිභෝගික ගිවිසුම යටතේ ගණුදෙනුකරු වෙත එහි වගකීම් උත්තරණය කර ඇති විට මෙම ගිවිසුම අලෙවි නියෝජිත විසින් සමාප්ත නොකළ යුතු වේ.

6.4 යම් හෙයකින් කිසියම් සමාප්තිකරණයක් සිදු වුව ද මෙම ගිවිසුම අවසන් කිරීමට පෙර පාර්ශ්වයන් විසින් එළඹ ඇති ගනුදෙනුවලට අදාළ ව හෝ එම ගනුදෙනුවලින් ව්‍යුත්පන්න වූ සියලුම අයිතීන්, වගවීම් සහ බැඳීම් සම්බන්ධයෙන් කටයුතු තව දුරටත් පවතින අතර අදාළ

පාර්ශ්වයන් වෙත හෝ ඔහුගේ/එහි උරුමක්කළරයන්, පරිපාලකයන්, නීතිමය නියෝජිතයින් හෝ අනුප්‍රාප්තිකයන් වේෂ්ටනය සහ වගකීමෙන් බැඳීම සිදු වෙයි.

## 7. විවිධ

7.1 අදාළ නීති හා රෙගුලාසිවල සහ/හෝ නියෝජිතයාගේ ප්‍රතිපත්ති වෙනස් වීම නිසා ඇති වන කිසියම් සංශෝධන මෙහිලා අනුගත විය යුතු වන අතර සංශෝධනය වූ අදාළ වගන්ති හෝ අවශ්‍ය කෙරෙන සංශෝධන සනාථ කිරීම ඇතුළු ව වැඩිදුර ක්‍රියාමාර්ගයකින් තොරව සේවාදායක වෙත නියෝජිතයාගේ දැනුම් දීමක් අනුව සංශෝධනය කරන ලද වගන්ති අන්තර්ගත වේ.

7.2 මෙම ගිවිසුම යටතේ සියළුම දැන්වීම්, ඉල්ලීම්, වුවමනාවන්, මනාපයන්, උපදෙස් හෝ වෙනත් සන්නිවේදනයන් ලිපි මඟින් ලිඛිතව දැක්වීම හෝ ඉහතින් දැක්වූ පරිදි අදාළ පාර්ශ්වයේ ලිපිනය වෙත බාර දෙනු ලැබීමෙන් හෝ පැහැදිලි ලෙස සම්ප්‍රේෂණයක් පවතින බවට ඇති තහවුරු කිරීමත් සමඟින් අදාළ පාර්ශ්වය විසින් දැනුම් දෙනු ලැබූ විද්‍යුත් තැපැල/ෆැසිමයිල් සඳහා යොමු කළ යුතු වේ. ලබන්නාගේ ලියාපදිංචි ලිපිනය වෙත යොමු කරනු ලබන කිසියම් නිවේදනයක් එය

ලැබූ බවට වන තහවුරු කිරීමක් සහිත විය යුතු අතර එය තැපැල් කිරීමේ සිට වැඩ කරන දින 03ක් ඇතුළත ලැබීමට සැලැස්විය යුතුය. කිසියම් පාර්ශ්වයක් විසින් අනෙක් පාර්ශ්වය වෙත ලබා දුන්තැපැල් /බාර දීම්/ෆැසිමයිල්/ඊමේල් ආදී ලිපිනයන්ගේ කිසියම් වෙනසක් වුවහොත් වහා ඒ පිළිබඳ ව ලිඛිතව දැනුම් දීමට අදාළ පාර්ශ්ව කටයුතු කළ යුතුය. කිසියම් ආසාර්ථකභාවයක් ඇති වූ අවස්ථාවක දී අවසන්වරට නිවේදන බාර දෙනු ලැබූ ලිපිනයන් (ෆැක්ස් හෝ ඊමේල් ද ඇතුළත්ව) වෙත බාර දෙනු ලැබීමට වලංගු බාර දීමක් ලෙස සලකනු ලැබේ.

7.3 මෙම ගිවිසුමේ කිසියම් විධිවිධානයක් හෝ කොන්දේසියක් වලංගුනොවන බවට අවසන් වශයෙන් තීරණය කෙරුණහොත් හෝ ක්‍රියාත්මක කළ නොහැකි බවට කිසියම් අධිකරණයක්, නියාමන පද්ධතියක් හෝ අර්ධ නියාමන පද්ධතියක් විසින් තීරණය කළ විට, එබදු අවලංගුතාව හෝ

බලාත්මක කිරීමේ නොහැකියාව අදාළ විධි විධාන හෝ කොන්දේසි වෙත ඇඳිය යුතුය. සෙසු විධිවිධාන සහ කොන්දේසිවල වලංගුතාව ඉන් බලපෑමට නතු නොවිය යුතුය.

7.4 මෙම ගිවිසුමේ ඉංග්‍රීසි, සිංහල සහ දෙමළ පිටපත්හි අසංගතතාව පිළිබඳ ගැටලුවක් මතු වූ විට ඉංග්‍රීසි පිටපත ප්‍රමුඛත්වයේ ලා සැලකෙන අතර සිංහල සහ දෙමළ පිටපත් ඊට අනුකූල ලෙස ගොඩනැගිය යුතු වේ.

7.5 නියෝජිතයා විසින් හෝ අදාළ කාර්ය මණ්ඩලය විසින් සපයනු ලබන සේවාව පිළිබඳ ගනුදෙනුකරුවා අතෘප්තිමත් වන අවස්ථාවක දී නියෝජිතයා විසින් ඉදිරිපත් කර ඇති පැමි□ලි නිරාකරණ ක්‍රියාපටිපාටිය අනුව නියෝජිතයාගේ බලයලත් පිරිසක් වෙත ගනුදෙනුකරුවා යොමු විය යුතු අතර ඇමිණුම අ යටතේ එහි සාරාංශයක් ඇඳා තිබේ.

7.6 මෙම ගිවිසුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ නීතිය මගින් පාලනය විය යුතු අතර ශ්‍රී ලංකා අධිකරණයට මෙහිදී සුවිශේෂී අධිකරණ බලයක් හිමිවේ.

7.7 ගනුදෙනුකරුවන් ලියාපදිංචි කිරීමේ ආකෘතිපත්‍රය, ණශඝ ආකෘති පත්‍රය, කොටස් ආයෝජන ගිණුම සනාථ කිරීම සහ නියෝජිතයා විසින් පනවනු ලැබූ වෙනත් අවශ්‍යතා සම්පූර්ණ කිරීම සහ පිළිගැනීම මත සුරැකුම්පත් ගිණුමක් ආරම්භ කිරීම සඳහා එකඟ වීම සහ පිළිගැනීම ගනුදෙනුකරුවා සිදු කරයි.

මීට සාක්ෂි වශයෙන් ඉහතින් දැක්වූ දිනය ප්‍රකාරව ගිවිසුම නිර්මාණය කොට ක්‍රියාත්මක කෙරිණ.

| | |
|---|---|
| NSB ෆන්ඩ් මැනේජ්මන්ට් සමාගම | (ගනුදෙනුකරුගේ නම) |
| විසින්: | විසින්: |
| නම: | නම: |
| තත්ත්වය: | තත්ත්වය: |
| සාක්ෂි දරන ලද්දේ: | සාක්ෂි දරන ලද්දේ: |

(ඒකාබද්ධ අයදුම්කරු)

ගනුදෙනුකරුගේ අත්සන:

නම:

තත්ත්වය:
සාක්ෂි දරන ලද්දේ: